පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ජනවාරි මාසය 04 සතිය

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

ශ්‍රේණිය - 9

පාසල - ර/නිවි/කරවිට මධ්‍ය විද්‍යාලය

නිපුණතාවය :- නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම :- විවිධ අවශ්‍යතා සඳහා පෝස්ටර් චිත්‍ර ලේබල් නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම :- "වන සම්පත සුරකිමු" තේමාව ආශ්‍රයෙන් පොස්ටර් චිත්‍ර නිර්මාණය කරයි

පැවරුම :- පහත පියවර ආශ්‍රයෙන් නිර්මාණ කරණයේ යෙදෙමු.

පියවර 01 :- ඔබ නිවසේ ඇති විවිධ තේමා ආශ්‍රයෙන් නිම වූ පෝස්ටර්, දැන්වීම්, දවටන, ලේබල් ආදිය එක් රැස් කර ඒවායේ සුවිශේෂතා හඳුනා ගනී.

පියවර 02 :- ඒවායේ යොදා ඇති නිර්මාණාත්මක අක්ෂර සරල රූප වර්ණ රේඛා ආදීය හොඳින් අධ්‍යයනය කර තේමාව මතුකරන ආකාරය නිරීක්ෂණය කරන්න.

පියවර 03 :-ඔබ ලබා ගත් අවබෝධය අනුව සරල වැකි හා සරල රූප යොදා ගනිමින් " වන සම්පත සුරකිමු" මැයෙන් පෝස්ටරයක් සැලසුම් කරන්න.

පියවර 04 :- සැලසුම් කිරීමේදී කාලීන සමාජයේ පවතින පාඨකයාට වේගයෙන් පනිවිඩය දැනෙන පරිදි නිර්මාණය කරන්න.

පියවර 05 :- ඔබ නිර්මාණය කර ගත් පෝස්ටරය ගැලපෙන වර්ණ යොදා ගනිමින් වර්ණ කරන්න.